# සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)

අපේක්ෂකයාගේ නම- ------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- ------------------------------------------------------------------------------
------------------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට අඩු / 201-500 / 501 ට වැඩි

කොට්ඨාසය- ------------------------------------------------------------------------------------------

කලාපය- ---------------------------------------------------------------------------------------------

10 ශ්‍රේණිය **ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන** කාලය පැය 03 (මුළු ලකුණු 100)

1 කොටසින් එකක්ද 11 කොටසේ (අ) යටතේ එකක්ද (ආ) යටතේ එකක්ද (ඉ) යටතේ එකක්ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

## 1 කොටස

පහත දැක්වෙන අ,ආ,ඉ,ඊ යන විස්තර අතුරෙන් එකක් තොරාගෙන වචන 350කට නොඅඩු රචනයක් ලියන්න.ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ප්‍රෞඪ ඉතිහාසයක් හිමි ශ්‍රී ලාංකිකයෝ අතීතයේ ජන සාහිත්‍යයක් ගොඩ නැගූහ .ජන කවි ජන නාට්‍ය ජන කතා එහි අංගයන්ය.ජන සාහිත්‍ය යේ ප්‍ර යෝජන රැසකි.වත්මන් සන්නිවේදන තාක්ෂණයේ දියුණුව හේතුවෙන් ජන සාහිත්‍ය අභාවයට යනු දැකිය හැකිය.ශ්‍රී ලාංකිකයන් ලෙස ජන සාහිත්‍ය රැක ගැනීමට සුදුසු වැඩ පිළිවෙලක් යෝජනා කළ යුතු කාලය එළඹ ඇත.

(ආ) පුරාවස්තු රටක අනන්‍යතාවය පිළිබිඹු කරන කැඩපතක් බඳු ය.ශ්‍රී ලාංකික පුරාවස්තු නැරඹීමට දෙස් විදෙස් සංචාරකයෝ විශාල වශයෙන් පැමිණෙති.ඒ තුළින් ආර්ථිකයටද දැඩි සවියක් වී ඇත.වර්තමානයේ විවිධ බලපෑම් හේතුවෙන් පුරාවස්තු විනාශ වෙමින් පවති.ලාංකේය හෙළ කලාකරුවාගේ කලා කුසලතාව ලොවට විදහා දක්වන පුරාවස්තු සංරක්ෂණය සඳහා පියවර ගැනීම කාලෝචිතය.

(ඉ) විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව නිසා අද මුළු ලෝකයම සංවර්ධනය කරා වේගයෙන් ප්‍ර වේශ වෙමින් පවතී.වෛද්‍ය ,ඉංජිනේරු,සන්නිවේදන ක්ෂේත්‍රවල මහත් දියුණුවක් ලබා ඇත.එහෙත් මිසයිල ප්‍රහාර,න්‍යෂ්ටික අවි ආදි අහිතකර දේවල්ද විද්‍යාවේ දියුණුව නිසා සිදු වී ඇත. විද්‍යාව හා තාක්ෂණය මිනිසාගේ අභිවෘද්ධිය සඳහා විය යුතුය.

(ඊ) රටක ජීවනාලිය තරුණ පරපුරය.රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට දැඩි රුකුලක් වන්නේ තරුණ පරපුරය.කොරෝනා වසංගතය හේතුවෙන් බොහෝ තරුණ තරුණියන්ට රැකියා අහිමි විය.තවත් පිරිසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටිති.මේ තත්ත්වය වළක්වා තරුණ පරපුර රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට සෘජුව දායක කර ගැනීමේ වැඩසටහන් සැකසිය යුතුය.

(ලකුණු 40)

11 කොටස

(අ) I . කහවත්ත මහා විද්‍යාලයේ සිංහල සාහිත්‍ය සංගමය 10 ශ්‍රේණිය සිසුන් සඳහා එක් දින චාරිකාවක් සූදානම් කර ඇත.සිසුහු 110 දෙනෙක් සහභාගී වීමට නියමිතය.කොළඹ ප්‍ර දේශයේ ස්ථාන කිහිපයක් නැරඹීමට යෝජනා වී ඇත.2024 ජුනි මස 5වන දින චාරිකාව යාමට සූදානම් කර ඇත.බස්රථ දෙකක් ලබා ගැනීමටත් මිල ගණන් දැන ගැනීමටත් ඩිපෝ අධිකාරිවරයා වෙත යවන ලිපිය ලියන්න.ඔබ සංගමයේ ලේකම් පියල් සඳකැලුම් යැයි සිතන්න.

(ලකුණු 20)

II. රක්වාන සුරැකි මරණාධාර සමිතිය මගින් භාණ්ඩ තැන්පත් කිරීමට නව ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.එම ගොඩනැගිල්ල සඳහා විදුලිය ලබා ගැනීමට විදුලි අධිකාරිවරයා වෙත යවන රාජකාරි ලිපිය ලියන්න.ඔබ මරණාධාර සමිතියේ ලේකම් කිත්සිරි ජයවීර යැයි සිතන්න .

ආ) I. මේ දිනවල පවතින අධික උෂ්ණත්වය හේතුවෙන් බොහෝ චර්ම රෝග හටගනිමින් පවතී. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ එළිමහන් ක්‍රියාකාරකම්වල නිරත වීම නිසා අව්රශ්මියේ බලපෑමට ලක් විමය. අව්රශ්මියෙන් ආරක්ෂා වීමට ගතයුතු ක්‍රියාමාර්ග ද වැළදී ඇති චර්ම රෝග පිළිබඳවද ඒවා සුවකර ගැනීමට ගතයුතු පියවර සඳහන් කරමින් ජනතාව දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාව සකසන්න. ඔබ ජයසෙන්පුර ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය පරීක්ෂක යැයි සිතන්න.
(ලකුණු 20)

II.තිහව ප්‍රාදේශීය වාර්තාකරු අමිල සංජීව මහතා විසින් ලියන ලද කෙටි සටහනක් පහත දැක්වේ.

- අවස්ථාව:සිහිති බක්මහ උළෙල
- ස්ථානය: දිලෙන කැකුළු මුල් ළමා විය මධ්‍යස්ථානය
- දිනය: 2024.04.30 පෙ.ව .9.00
- විශේෂ ආරාධිත අමුත්තා : මුල් ළමා විය පුහුණු උපදේශක නාරද යසරත්න
- නාරද යසරත්න මහතාගේ කතාව: දරුවන් සහජ දක්ෂතාවලින් පිරි දරු පිරිසක් බව

ඉහත කෙටි සටහන ඇසුරින් ප්‍රාදේශීය වාර්තාකරු ඔබ යැයි සිතා පුවත්පතක පළ කිරීමට වාර්තාවක් සකස් කරන්න .(වචන 100 ප්‍රමාණවත්ය) (ලකුණු 20)

(ඉ) I. නුගේගොඩ මහ වීදියේ අංක 55/1 ස්ථානයේ නැණස නමින් පොත්හලක් විවෘත කර ඇත.විවිධ වර්ගයේ දේශීය විදේශීය නව කතා කෙටිකතා හා කතන්දර පොත්ද විවිධ විෂයන් අරමුණු කරගත් පොත්ද පහසු මිළ ගණන් යටතේ විකිණීමට තිබේ. ජුනි, ජුලි මාසවල 30% .වට්ටම් සහිතව පොත් ලබා ගතහැකිය. දිනපතා උදේ 8.30 සිට රාත්‍රී 7.30 දක්වා විවෘතව පවතී.පොහොය දිනවල වසා තැබේ.නව පොත්හල ප්‍රචාරක කටයුතු සඳහා 2024 මැයි මස 30 වැනි දින පළ කිරීමට අදහස් කරන දැන්වීම ලියන්න.

(ලකුණු 20)

II.දොරපනේ මහ විද්‍යාලයේ සිංහල සාහිත්‍යය සංගමය 2024 ජුනි මස පැවැත්වීමට නියමිතය.6-13 ශ්‍රේණිවල දරුවන් නාට්‍ය තරඟාවලියක් සූදානම් කර ඇත. මෙහි වැඩසටහන් විස්තරයට අදාළ සියලු අංග ඇතුලත් වන පරිදි කාල කළමනාකාරිත්වයෙන් යුක්තව න්‍යාය පත්‍රයක් සකස්කරන්න.

(ලකුණු 20)